# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

2 ශ්‍රේණිය - බුද්ධ ධර්මය - ජූලි මාසය - 4 වන සතිය

සැකසුම :- බලංගොඩ අධ්‍යාපන කලාපය.

M.A.R.P.කුමාරි - ර/රත්මලවත්ත මහා විද්‍යාලය

## අපේ ගෙදර පින්කමට සූදානම් .

දුවලා පුතාලාට මතකද ඔයාලගේ ගෙදර ,එහෙම නැතිනම් නෑදෑ ගෙදරක දානමය පින්කමක් තිබුණු අවස්ථාවක්.

බෞද්ධ හැම ගෙදරකම වාගේ දානමය පින්කම් සිද්ධ වෙනවා.මේ දානමය පින්කම් සිදු කරන පිළිවෙළක් තියෙනවා.

අපි මුලින්ම පන්සලේ ලොකු හාමුදුරුවන්ට ආරාධනා කරලා දිනයක් වෙන් කර ගන්නවා.

ඊට පස්සේ ගෙදර සියලු දෙනාම සූදානම් වෙනවා දානමය පින්කම පිළිවෙළට කර ගන්න .

1. එහිදී ධාතු කරඬුව හා සගරුවන වැඩම කරවීම.

2. සුදු ඇතිරිලි හා ආසන පිළියෙල කිරීම.

3. පා දෝවනය කිරීම හා පිසදැමීම.

4. වැද නමස්කාර කර පිළිගැනීම .

5. බුද්ධ පැවැත්වීම.

6. දන් පැන් හා පිරිකර පූජා කිරීම.

7. පැන් වැඩීම.

යන කාරණා ගැන විශේෂයෙන් සැලකිලිමත්ව කටයුතු කරන්න ඕනි.

දානය කොහේ දුන්නත් මේ ගැන සැලකිලිමත්ව දන් දෙන්න ඕනි.

පුතාලා දන්නවා අපි පාසලේදීත් සිල් වැඩසටහන් කරද්දී ස්වාමීන් වහන්සේලාට දානේ පූජා කරනවා.

එහෙමනම් ඔයාලා ඒ දානමය පිංකමේ අවස්ථාවක් චිත්‍රයට නගන්න .

මේ පාඩමට අදාළ වීඩියෝ පාඩම සදහා you tube එකට ගොස් Renuka kumari .අපේ ගෙදර පින්කමට සූදානම් ලෙස type කරන්න.

**"හොදයි ආදරණිය දුවේ, පුතේ ඔයාලට තෙරුවන් සරණයි!"**